# 10 කෑරගලය වැජඹෙයි මේ ලෙසින් සිට...

වීදාගම මෛත්‍රේය මාහිමි
(කෝට්ටේ අවධිය)

## හංස සන්දේශය

මෙය කෝට්ටේ රාජධානි සමයෙහි (ක්‍රි.ව. 1412 - 1580) සවන පරාක්‍රමබාහු රජ දවස (ක්‍රි.ව. 1415 දී පමණ) රචනා වූවකි. හංසයකු දූතයා කර ගෙන පණිවුඩය යවන බැවින් හංස සන්දේශය යන නම යෙදී ඇත. කර්තෘ පිළිබඳ පැහැදිලි සඳහනක් නැතත්, මෙහි රචකයා වීදාගම මෛත්‍රේය මාහිමි බව විද්වතුන්ගේ පිළිගැනීම යි. **බුදු ගුණ අලංකාරය, ලෝවැඩ සඟරාව, දහම් ගැට මාලාව, එළු අත්තනගලු වංශය, කව් ලකුණු මිණිමල** එහිමියන් ලියූ අනෙකුත් ග්‍රන්ථ ලෙස සැලකේ. කෝට්ටේ රාජධානි සමයෙහි පහළ වූ ප්‍රකට සාහිත්‍යධරයන් අතර වීදාගම හිමියන්ට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි.

හංස සන්දේශයෙහි නිමිත්ත වනුයේ කැරගල වනරතන හිමියන් ලවා සමන්, විභීෂණ, උපුල්වන් හා කඳකුමරු යන දෙවිවරුන්ට පිරිත් කියා පින් දී, එමගින් සිරි පැරකුම්බා රජ කෙරෙහි කරුණාවෙන් සෙත සලසවන ලෙස ඉල්ලීම යි.

මෙහි එන පරිසර වර්ණනාවන්ගෙන් කැරගල වැනුම ඉතා අව්‍යාජ එකකි. ස්වභාව සෞන්දර්යයෙන් අනූන ආගමික පසුබිමක් සහිත කැරගල ගම්පියස දූතයාගේ සිතෙහි සතුට වඩවයි. සරුසාර කෙත්වත්, මිහිරි පලතුරු, ගලා බස්නා සිහිල් ජලයෙන් යුත් ඇළදොළවලින් මෙගම් පියස සමන්විත විය.

කැරගල යනු බස්නාහිර පළාතට අයත් සියනෑ කොරළයේ ගඟබඩ පත්තුවේ පිහිටි විශාල ගමකි. මෙය කැරගල නම් පර්වතයක් ආසන්නයේ පිහිටියේ ය. මෙම පර්වතයෙහි කරකොළ ගස් තිබූ නිසා කරගල, කැරගල වී ය යි ද කුරතම්පලා ගස් තිබූ හෙයින් කුරගල, කැරගල වී ය යි ද ජනප්‍රවාදයේ විවිධ අදහස් එයි. රසවාහිනියෙහි වත්ථුලපබ්බත යන නමින් සඳහන් වන්නේ ද කැරගල බව පැවසේ. කෙසේ වෙතත් කැරගල ගම් පියසෙහි පිහිටි පද්මාවතී පිරිවෙන් විහාරය ගමෙහි භෞතික දියුණුව මෙන් ම ජනතාවගේ ආධ්‍යාත්මික දියුණුව ද සංකේතවත් කරවයි. චමත්කාරජනක පරිසරයක් චිත්‍රණය කරන කැරගල වෙහෙර වැනුම දැක්වෙන පැදි කිහිපයක් මෙම පාඩමින් ඉදිරිපත් කෙරෙයි.

1. සා ර පලය අඹ දඹ රඹ ද වල් පිට
මී ර ජලය ඇළ දොළ කඳු පිටින් බට
නෑර ලොලය වඩවන දුටු දනන් හට
කෑර ගලය වැජැඹෙයි මේ ලෙසින් සිට

දඹ - ජම්බු වල්පිට - වනාන්තරයෙහි

## අර්ථය

සාරවත් ඵලවලින් යුතු අඹ ජම්බු කෙසෙල් ගස්වලින් පිරුණු වන බිම් ද කඳුවලින් ගලා බසින මිහිරි දිය පිරුණු ඇළ දොළ ආදියෙන් ද යුතු (ඒවා) දකින ජනතාව හට බොහෝ සෙයින් ආශාව ඇති කරවන කෑරගල මෙසේ විරාජමාන (බබළමින්) වෙයි.

2. කුළින් කුළම සිහිල’ඹ වැහෙන කඳුරුය
දොළින් දොළම කල් යල් කරන කුඹුරුය
පළින් පළම තල් පොල් ගෙ වතු මැඳුරුය
තළින් තළම පුල් පියුමු’පුල පඬෙරුය

කුළින් - පර්වත, කූට, කඳු සිහිල’ඹ - සිහිල්+අඹ (සීතල ජලය)
කඳුරු - දිය පාරවල් තළින් - තඩාග, විල්
පඬෙර - සුදු නෙළුම්

## අර්ථය

කඳු මුදුනක් පාසාම සිහිල් ජලය වැහෙන දිය පාරවල් ය. සෑම දොළක් අසල ම කල් යල් බලා (යල මහ දෙකන්නය ම) වගා කරන කුඹුරු ය. තැනින් තැන තල් ගස් ද පොල් ගස් ද සහිත ගෙවතු හා විශාල ගෙවල් ය. විලක් විලක් පාසා ම පිපුණු නෙළුම්, මානෙල් හා සුදු නෙළුම් ය.

3. පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට
ඇසෙයි ළමා වසුපැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට
රසෙයි අමා රසමය ඒ පියස දුට

සුවඳැල් - සුවඳ+ඇල් (ඇල් වී වර්ගයකි) දිසෙයි - දෘශ්‍යමාන වෙයි, පෙනෙයි
අමාරස - අමෘත රසය රසෙයි - රස + එයි (රසයක් එයි දැනෙයි)

## අර්ථය

හාත්පසින් ම නිතර කෙත්වතුවල සුවඳැල් නම් වී වර්ගය පැසෙයි. කුඩා වසු පැටවුන්ගේ නාදය (හඬ) ඈතට ඇසෙයි. එහි විහාරස්ථානය දිව්‍ය විමානයක් ලෙසට පෙනෙයි. ඒ ප්‍රදේශය දුටු විට අමෘත රසයක් හිතට දැනෙයි.

★ මෙහි සඳහන් වෙහෙර, කෑරගල පද්මාවතී පිරිවෙන් විහාරයයි.

4. නිබඳ පැසී පල ලඹ දෙන මිහිර'ඹය
සුවඳ විහිද සිටි විලිකුන් කැන් රඹය
නොමඳ තැනින් තැන වලු බර වනරඹය
එමැද වෙහෙර දිලි දුර ලන සසරබය

ලඹ දෙන - එල්ලෙන
විලිකුන් - ඉදුණු
වනරඹ - වන කෙසෙල්, වල් කෙසෙල්
මිහිර' ඹ - මිහිරි+අඹ
රඹකැන් - කෙසෙල් කැන්

### අර්ථය

නිරන්තරයෙන් ම පැසී ගෙඩි එල්ලෙන මිහිරි (මධුර) අඹ ද සුවඳ විහිදුවන්නා වූ ඉදුණු කෙසෙල් කැන් ද අඩුවක් නැති ව තැනින් තැන වලුබර වූ වල් කෙසෙල් (වන කෙසෙල්) ද දක්නට ලැබෙන්නා වූ එම ප්‍රදේශය මධ්‍යයෙහි සංසාර බය දුරලන්නා වූ විහාරය බබළන්නේ ය.

5. මිහ'ඹමුව මඬල මෙන් දිලෙන හැම විට
දුලබ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර සිට
කිරඹ පොකුරු මී රස ලැබ බොන ලෙසට
නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු කොට

මිහ'ඹ - මිහි+අඹ = මහී කාන්තාව, මිහි කත
කිරඹ - කිරි+අඹ = කිරිවතුර
පොකුරු මී - පුෂ්පකර මඳු, පියුම් පැණි

### අර්ථය

මිත්‍රය, මහී කාන්තාවගේ මුහුණ මෙන් නිතර බබළන ඉතා දුර්ලභ ඉසුරින් (සම්පතින්) පිරුණු ඒ විහාරයේ සිට කිරි දිය හා මල් පැණි ලැබී බොන්නාක් මෙන් ඔබගේ නෙත් සිත් සතුටු කරමින් (ඒ විහාරය) නරඹන්න.

6. දිමුත් වෙහෙර වට විසිතුරු මල් වතුය
එහිත් සුවඳ මල් නිති වෙයි මිණි මුතුය
මහත් තුරු මියුරු පල ගෙන නැමී අතුය
රැගත් සෙවණ නො හැරම සිටි පොල් වතුය

වෙහෙර'වට - වෙහෙර+අවට
මිණිමුතු - මණි මුක්ත (කොපුවෙන් මිදුණු) පිපුණු යන අර්ථය යි.
මහත් තුරු - විශාල ගස්

### අර්ථය

දීප්තිමත් (බබළන) ඒ විහාරය අවට විචිත්‍ර වූ මල්වතු ය. නිරන්තරයෙන් එහි සුවඳ මල් පිපෙයි. විශාල ගස්වල රසවත් එල සැදී අතු නැමී ඇත. එමෙන් ම නිතර ම සෙවණ දෙන්නා වූ පොල් වතු ද සහිත ය.

7. නොයෙක් තැන ම පිපි මල් පිරුණු    පොකුණුය
ගෙයක් කන ම සැදැහෙන් දෙවන    දකුණුය
සුදක් ලෙස තිබෙයි මළු මං හැර    කුණුය
සියක් අය කෙරෙති වැඳ පුද    පැදකුණුය

ගෙයක් කන ම - මෙහි 'කන' යන්නෙන් සූචනය වන්නේ කෙළවර, කොන, මුල්ල, දිසාව යන අර්ථයන් ය. මේ අනුව ගෙයක් පාසා ම යන අර්ථය පිළිගත හැකි ය. 'පිළිකන්න' වැනි ගැමි ව්‍යවහාරයක ද අපට මේ අර්ථය හඳුනා ගත හැකි ය.

### අර්ථය

නොයෙක් තැන්වල පිපුණු මල්වලින් පිරුණු පොකුණු ය. සෑම ගෙයක් දෙස ම ශ්‍රද්ධාවෙන් දෙන දක්ෂිණය (දානය ය). මිදුල් හා මාර්ග (පාරවල්) කුණු කසළ ඉවත් කර පිරිසිදු ව සුදු පැහැයෙන් තිබෙයි. සිය ගණනක් පිරිස වැඳීම පිදීම් ප්‍රදක්ෂිණා කරති.

8. නුදුරු වැ සිහිලැ' ලී ය ගඟුලැ'    ලී ය
වට සැදි මල් වැ ලී ය සුදු    වැලී ය
පිපි වන සිටි ම ලී ය වන    මලී ය
තුටු වන සිති වි ලී ය පුල්    විලී ය

සිහිලැ'ලීය - ඉතා ශීතල    ගඟුලැ'ලීය - දිය ඇලි
වට - අවට    පුල් විලීය - පිපුණු මල් ඇති විල්

### අර්ථය

(වෙහෙරට) ආසන්නයෙහි ශීතල දිය ඇලි ය. අවට මල් සැදුණු මල් වැල් හා සුදු වැලි තලා ය. පිපුණු පරිද්දෙන් ම පවතින මල් ඇති වන මල් ය. සතුටු සිතිවිලි ඇති කරවන පිපුණු මල් ඇති විල් ය.

9. පවන' ද පිපි තු රේ ය නිර    තුරේ ය
කුසුමන් පෙති තු රේ ය මළු    තුරේ ය
අවට සුපිපි සී රේ ය බිඟු    සරේ ය
සිත එවෙහෙර කෙ රේ ය ලොබ    කෙරේ ය

පවන'ද - පවන්+අද (සුළඟ අවුත්)    සරේ ය - විල්වල
බිඟු සරේ ය - භෘංග නාදය

### අර්ථය

සුළඟ ඇවිත් නිරන්තරයෙන් මල් පිපුණු ගස්වල මල් පෙති මළුවෙහි අතුරවයි. හාත්පසින් මල් පිපුණු විල්වල මී මැසි නාදය ඇසෙයි. (ඇසූ දුටු) අයගේ සිත ඒ වෙහෙර කෙරෙහි ආසාව ඇති කරයි.

10. දුටු සත  සිතට තුටු වන ලෙසට  නිතියෙනි
සතර'ත  එකට සම කර බෙර ඇසක්  මෙනි
පැහැපත සුද නොහළ වැලි අතුළ මළු  තැනි
මිහිකත  සඳන'ලෙව් දුන් උර මඬල  වැනි

සුද නොහළ - සුදු පාට අත් නොහළ (සුදු පැහැය සහිත බව කියූ අන්දම යි).
වැලි අතුළ මළු තැනි - වැලි අතුරන ලද (විහාර) මිදුල්
සඳන'ලෙව් දුන් - සඳුන්+අලෙව් දුන්. චන්දන ආලේප දෙන ලද
උර මඬල - උර ප්‍රදේශය

### අර්ථය

දකින ජනයාගේ සිතට නිත්‍ය වශයෙන් ම සතුටු ඇති වන ලෙස සතර පැත්තෙන් ම එකම ආකාරයට බෙර ඇසක් මෙන් සමතලා කර සුදු පැහැති ලස්සන වැලි ඉස ඇති (විහාර) මිදුල මහී කාන්තාවගේ සඳුන් ආලේප කළ උර ප්‍රදේශය මෙනි.

## අභ්‍යාස

1. සැප සම්පතින් ආඪ්‍ය ඉපැරණි ගමක තොරතුරු කවි පන්තියෙන් ඉදිරිපත් කරන ආකාරය පැහැදිලි කරන්න.

2. මෙම පාඩමේ එන පරිසර වර්ණනාවල විචිත්‍රත්වය අගය කරන්න.

3. හංසයා දකින චමත්කාරජනක ගම් පියසෙහි අසිරිය විස්තර කරන්න.

4. හංස සන්දේශ කතුවරයා අර්ථ රසය මෙන් ම ශබ්ද රසය ද මැනවින් යොදාගෙන ඇති ආකාරය කවි පන්තිය ඇසුරෙන් පැහැදිලි කරන්න.

5. ගම සහ පන්සල අතර ඇති අන්තර් සම්බන්ධතාව කවියා විස්තර කරන අයුරු විමසන්න.